# පූර්ව ඓතිහාසික අවධියේ පදවිගම්පල තදාශ්‍රිත ප්‍රදේශයේ සංස්කෘතික භූ දර්ශනය

**එස්.එම්.එස්.ඩී.බී. සමරකෝන්**
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
duminda901@gmail.com

ප්‍රමුඛ පද : භූ දර්ශනය, ලෙන්, කටාර ලිපි, සුසානය

**හැඳින්වීම**

පැරණි මානවයා පරිසරය තමාට ගැලපෙන අයුරින් ගොඩනගා ගැනීම නොව පරිසරයට අනුව තම අවශ්‍යතා සපුරා ගැනීම සිදුකරනු ලැබී ය. මේ මගින් මානවයා හා පරිසරය අතර පැවති අන්‍යෝන්‍ය සම්බන්ධය වටහාගත හැකි ය. අතීත මානවයාගේ සියලු ක්‍රියාවන් භූ දර්ශනය මත රඳා පැවති බව පැහැදිලි ය. මෙම භූ දර්ශනය යනු භූගෝල විද්‍යාව හා බැඳුණු සංකල්පයකි. භූ දර්ශනය යනු, යම් කිසි ප්‍රදේශයක පවතින භෞමික නොහොත් භූමියේ ස්වරූපයයි. එයට කඳු පද්ධතිය, ගංගා නිම්න, වියළි නිම්න වැනි දෑ අයත් වේ. මෙම ලක්ෂණ යම්කිසි කලාපයක ජීවත් වන මිනිසුන් දක්නා ආකාරය ලෙසභූ දර්ශනය පෙන්වා දිය හැකි ය. මෙම පර්යේෂණය සිදු කරනු ලබන්නේ යම් කිසි සමාජයක්, සංස්කෘතියක් ගොඩනැගීම කෙරෙහි එම ප්‍රදේශයේ පවතින භූ දර්ශනය ඉවහල් වේ ද යන පැනයට පිළිතුරු සෙවීමයි. මෙකී අධ්‍යයනය සඳහා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පදවිගම්පල ආශ්‍රිත කලාපය තෝරා ගනු ලැබිනි. මෙම පර්යේෂණයේ ප්‍රධාන ම අරමුණ වන්නේ ඓතිහාසික යුග ගොඩනැගිම කෙරෙහි භූ දර්ශනය කෙතෙක් දුරට ඉවහල් වී ඇති ද යන්න අධ්‍යයනය කිරීමයි. මෙම කලාපය පිළිබඳ බොහෝ පර්යේෂණ සිදුකර තිබුණ ද භූ දර්ශනය පිළිබඳ කිසිඳු වාර්තාවක් සකස් වී නොමැත. එම රික්තය පිරවීමේ අරමුණ ද පෙරදැරි කරගෙන මෙම පර්යේෂණාත්මක වාර්තාව සිදු කිරිමට බලාපොරොත්තු වේ.

**ක්‍රමවේදය**

පදවිගම්පල ආශ්‍රිත කලාපයේ භූ දර්ශනය පිළිබඳව පර්යේෂණාත්මකව අධ්‍යයනය සිදු කරන ලද්දේ ක්ෂේත්‍රය ආශ්‍රිත අවිධිමත් ගවේෂණය සිදුකිරීමය. එහි දී හමුවූ සාධක නිසා මෙම ගවේෂණය විධිමත් ලෙස කිරීමට කටයුතු කරන ලදී. අධ්‍යයනය කිරිම සඳහා මූලික වශයෙන් දත්ත එකතු කිරීම කරන ලදී.දත්ත එකතුකර ගැනීමේ දී ප්‍රාථමික හා ද්විතියික දත්ත අධ්‍යයනය කෙරෙහි යොමු විය.

ප්‍රාථමික දත්ත එක්රැස් කිරීම සඳහා ක්ෂේත්‍රය ආශ්‍රිත දත්ත විමර්ශනයක යෙදිනි. පදවිගම්පල ආශ්‍රිත ව පවතින ලෙන්, සුසානය මෙන් ම මෙම ක්ෂේත්‍රය සම්බන්ධ පැරණි ස්ථාන වල ද අධ්‍යයනයන් කරනු ලැබීය. සම්මුඛ සාකච්ඡා මගින් ද තොරතුරු රැස් කරන ලදී. ද්විතියික දත්ත එකතු කිරීමෙ දී මූලික වශයෙන් සිදු කරනු ලැබුවේ පුස්තකාල අධ්‍යයනයයි. මෙම කාර්යයේ දී ක්ෂේත්‍රය ආශ්‍රිත තොරතුරු පවතින කෘති, සඟරා, පූර්ව පර්යේෂණ පිළිබඳ අවධානය යොමු කරන ලදී. භූ දර්ශනය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී මූලිකව එහි පිහිටීම පිළිබඳ ව යම් අවබෝධයක් ලබාගැනීම සඳහා ගවේෂණ කලාපයට අදාල සිතියම් අධ්‍යයනය කිරීම කරනු ලබයි. එහිදී 1:50,000 සිතියම යොදා ගැනිම සිදුකරයි. මෙම සිතියම් අධ්‍යයනය කරනු ලබන්නේ කලාපීය වශයෙන් පවතින විස්තාරණය හඳුනාගත හැකි බැවිනි. භූ විෂමතා සිතියම් ද මෙහි දී අධ්‍යයනයට බඳුන් කරනු ලැබීය. එ මගින් ප්‍රාදේශීය වශයෙන් විහි දී ඇති කඳු පද්ධතිය, ගංගාවන්, නිම්න ආදිය පිළිබඳවත් අතීත මාර්ග පද්ධතිය කුමන අයුරින් විහි දී තිබුණේ ද යන්න පිළිබඳවත් අවබෝධයක් ලබාගත හැකි බැවිනි.චන්ද්‍රිකා ඡායාරූප මගින් අවකාශීය වශයෙන් දක්නට ලැබෙන භූ ගෝලීය සාධක හඳුනාගත හැක. සමස්තයක් ලෙස භූමිය අධ්‍යයනය කිරිමට හැකියාව ලැබේ. එහි දී වර්තමානය වන විට දක්නට නොලැබෙන නමුත් විවිධ අතීත සාධක හඳුනාගත හැකි පරිදි මේ මගින් අධ්‍යයනය කළ හැකිය.මේ අයුරින් රැස් කළ දත්ත වර්ගීකරණය සිදු කර ඇත. අධ්‍යයනයේ පහසුව තකා ලෙන්, සුසානය, කටාර ලිපි ආදී ලෙස කොටස් 3ක් යටතේ සාකච්ඡාවට බඳුන් කෙරෙයි. ඒ අනුව සංස්කෘතික අවධියක් ගොඩනැගීම කෙරෙහි ප්‍රදේශයේ පවතින භූ දර්ශනය කෙතෙක් දුරට ඉවහල් වේ ද යන්න මේ සාධක තුළින් අනාවරණය වන පරිදි පර්යේෂණය සිදු කර ඇත. අවසාන වශයෙන් පර්යේෂණ ග්‍රන්ථයක් ඇසුරින් මෙය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

පදවිගම්පල කන්ද පුරා විහිදුණු පාෂාණ උද්ගතයෙහි ස්වභාවික ලෙන් විශාල ප්‍රමාණයක් හඳුනාගත හැකි ය. එහි කටාර සහිත හා කටාර රහිත ගල් ලෙන් විශාල සංඛ්‍යාවක් විසිරි පවතී. මෙම ගල් ලෙන් සියල්ල ම මූල ඓතිහාසික අවධියේ දී වාසස්ථාන සඳහා භාවිත කළ බව උපකල්පනය කළ හැකිය. කටාර සහිත ගල් ලෙන් වල භික්ෂූන් වහන්සේ ජීවත් වූ බව එහි සඳහන් ලෙන් ලිපි තුළින් හඳුනාගත හැකිය. නමුත් මෙහි පවතින කටාර රහිත ගල් ලෙන් වුව ද වර්ෂාවෙන් ආරක්ෂා වී ජීවත් විය හැකි පරිදි සකස් වී ඇති ස්වාභාවික ගල් ලෙන් වේ. තමන්ට එදිනෙදා අවශ්‍ය වූ නොයෙකුත් ආහාර ද මෙම ප්‍රදේශ වලින් සොයා ගැනිම පහසු කාර්යයක් බැවින් වාසස්ථාන ඉදිකර ගැනිමේ දී මෙ වැනි ස්වාභාවික ව පිහිටි ගුහා උපයෝගි කරගනු ලැබීම වඩාත් උචිත වේ. තාක්ෂණික වශයෙන් දියුණු වීමත් සමග මෙම

ගුහා තමන්ට අවශ්‍ය පරිදි සකස් කරගැනීම ඊට පසු අවධිය වන මුල් ඓතිහාසික යුගයන් හි දී දක්නට ලැබේ. ගල් ලෙන් කටාර සහිත ව ඉදිකිරීම ආගමික අවශ්‍යතා සඳහා මුල් වූ බව ඒවායේ අන්තර්ගත ශිලාලේඛන තුළින් හඳුනාගත හැකි ය. මුල් ඓතිහාසික ජනතාවගේ ජනාවාස ඉදිකර ගැනීමේ දී ප්‍රවණතාවක් ලෙස කටාර වලට අමතර ව ස්වභාවික ලෙනට පියසි ඉදිකිරීම ද දක්නට ලැබේ. පදවිගම්පල කන්දේ ඇති සමහර ලෙන් වල මේ අයුරින් පියසි ඉදිකිරීම සඳහා සකස් කළ කුහර දක්නට ලැබේ. එයින් පැහැදිලි වන්නේ ජනාවාස ස්ථාවර ලෙස ම මෙම කලාපය තුළ ඉදිකර ගැනීමට කටයුතු කළ බවයි. එලෙස ලෙන් ඇසුරින් සිය ස්ථාවර ජනාවාස ඉදිකර ගැනීමට නම් මෙම කලාපයේ පැවති විශේෂතා වැදගත් විය.

පදවිගම්පල මූල ඓතිහාසික යුගය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ දී වැදගත් සාධක වන්නේ සුසාන සම්බන්ධ තොරතුරු ය. මෙහි දක්නට ලැබෙන්නේ මෙගලිතික සංයුතියට අයත් ශිලා මංචක (Delmenoied) වර්ගයේ සුසානයකි. ලංකාවේ දැනට හමු වී ඇති මෙම වර්ගයේ එක ම සුසානය මෙය වේ. ඇතැම් විද්වතුන් මෙය ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් එකක් බව උපකල්පනය කළ ද ප්‍රදේශවාසීන් මෙය ගල් මැස්සක් ලෙස හඳුන්වනු ලබයි. දළ වශයෙන් ක්‍රි.පූ. 8 වන සියවසේ සිට ක්‍රි.ව. 3 වන සියවස දක්වා වූ කාල පරාසයක් මෙයට අයත් වේ. මෙයින් පැහැදිලි වන්නේ පදවිගම්පල කලාපය පූර්ව ඓතිහාසික සංස්කෘතික හු දර්ශනයට අයත් සාධක පෙන්වන වැදගත් ස්ථානයක් බව ය. මෙ වැනි සුසානයක් මෙම ස්ථානයේ ඉදිකිරීමට නම් ඒ සඳහා යෝග්‍ය අමුද්‍රව්‍ය තිබිය යුතු ය. සුසානය ඉදිකිරීම සඳහා භාවිත කර ඇත්තේ පාෂාණ ය. පදවිගම්පල කන්ද පුරා පාෂාණ බහුල ව පවතී. කඳු පාමුල මෙම සුසානය පිහිටා තිබීම නිසා එයට අවශ්‍ය අමුද්‍රව්‍ය ඉහළ කඳුකරයෙන් ලබා ගැනීමට හැකි විය. අවශ්‍ය වී ඇත්තේ පාෂාණ පුවරු සකස් කර ගැනීම සඳහා උචමනා වූ තාක්ෂණය පමණි. මූල ඓතිහාසික ජනයා ලෝහ තාක්ෂණය හඳුනාගත් පිරිසක් නිසා යකඩ කුඤ්ඤ (Cheseles) භාවිතයෙන් මෙම පාෂාණ හැඩගස්වා ගැනීම කළ බව උපකල්පනය කළ හැකි ය. එසේ නම් ලෝහ සකස් කර ගැනීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යය ද මෙම කලාපයේ තිබිය යුතු ය. සුසානය ඉදිකිරීමේ දී ඔවුන් හු විෂමතාව උපයෝගි කර ගත් බව පෙනේ. එ නම් කඳුකරය සිය ජනාවාස වලට වෙන් කරගෙන ඇති අතර පහළ කොටස තුළ මෙම සුසානය ඉදිකර ඇත. එයින් පැහැදිලි වන්නේ වාසස්ථානයෙන් බැහැර ස්ථානයක ඔවුන්ගේ සුසාන ඉදිකර ඇති බවයි.

පදවිගම්පල ප්‍රදේශයේ පැවති සමාජ හා ආර්ථික තත්ත්ව අධ්‍යයනයේ දී සංස්කෘතික හු දර්ශනය ඉවහල් වූ බව පැහැදිලි වේ. මෙහි විසූ ජනතාව මුල් කාලයේ එ නම් මූල ඓතිහාසික යුගයේ දී දඩයම් ජීවිතයක් ගෙවූ බව පෙනේ. ඊට අවශ්‍ය පාරිසරික

හැඩගැස්ම ද ප්‍රදේශයේ දක්නට ලැබේ. මෙහි පැවති වනාන්තර හා ඒ ආශ්‍රිත වූ ජලාධාර වල මත්ස්‍යයින් ද ඔවුන්ගේ ආහාර සඳහා භාවිත කළ බව උපකල්පනය කළ හැකි ය. එමෙන් ම විවිධ බෙල්ලන් වර්ග ද ආහාර පිණිස ගෙන ඇති බව ද දක්නට ලැබේ. පදවිගම්පල කන්දේ පවතින විශාලතම ගල් ලෙනෙ හි දැනුදු බෙල්ලන්ගේ අවශේෂ බොහෝමයක් විසිරී පවතී. එ බැවින් මේ අවශේෂ ද ඒ අවධියට ම අයත් බව උපකල්පනය කළ හැකි ය. පසු කාලීනව ඔවුන් ගොවිතැන කරා යොමු වී ඇත. පදවිගම්පල කන්දේ පවතින දළ බෑවුම නිසා නිරන්තර ඛාදනයට ලක් වේ. මේ හේතුවෙන් පහළ නිම්නය තුළ සරු දියළු පස තැම්පත් වී සාරවත් කෘෂි බිම් සැකසීම සිදුවේ. සරළ වාරි ක්‍රම යොදාගෙන තෙත් බෝග පවා තම ජීවනෝපාය සඳහා වගාකර ඇත. පදවිගම්පල කන්ද ආශ්‍රිත ව පවතින මුල් බ්‍රාහ්මී ශිලාලේඛනවලට අනුව එහි සමාජ තත්ත්වය විස්තර වී ඇත. මුල් ඓතිහාසික සමය වන විට සැකසෙන කටාර ලෙන් වල **පරුමක** පෙළපත් පිළිබඳ ව සඳහන් වේ. පරුමක වරුන් සිදු කළ පරිත්‍යාග හා ඔවුන් විවිධ තනතුරු දැරූ බව අන්තර්ගත ලෙන් ලිපි වල සඳහන් ය. මෙම පිරිසගේ නායකත්වය යටතේ පැරණි සමාජය ගොඩනැගී තිබූ බව පෙනේ. මෙහි පවතින තවත් ලිපියක **ගපති** හා **බතවරු** යන තනතුරු පිළිබඳව ද සඳහන් වේ. මේ අතරින් ගපති යන්න ගෘහපති යන්න අදහස් වන බව පැවැසේ. බතවරු විසින් වණික් හෙවත් වාණිජ කටයුතු මෙහෙයවා ඇත. මෙම කලාපය තුළ වූ සම්පත් වල අතිරික්තය ආර්ථික දියුණුවට බලපා තිබේ. මේ ලෙස ආර්ථික වර්ධනයකට හිමිකම් කියනු ලැබුවේ ද මෙහි පැවති භූ දර්ශනය හේතුවෙනි. සිවු දිගටම සම්බන්ධ විය හැකි ගමන් මාර්ගයක පිහිටි පදවිගම්පල ප්‍රදේශය අන්තර් පාරිසරික ක්ෂේත්‍ර සම්බන්ධ කරන ප්‍රදේශයක් ලෙස ද හැඳින්විය හැකි ය. පදවිගම්පලට සමීප ව පිහිටි පරපේ නම් ස්ථානයේ තිබී හමු වූ ලිපියක සඳහන් වන්නේ වෙළෙඳාම පිණිස පැමිනෙන පිරිස් විල්බාවට එන ලෙසයි. විල්බාව යනු පදවිගම්පලට සැතපුම් 8ක් පමණ උතුරින් පිහිටි දැදුරු ඔය නිම්නයේ ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානයකි. පදවිගම්පල යනු, මාඔය නිම්නයේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයයි. ඒ අනුව අන්තර් නිම්න යා කළ භූ දර්ශනයක් සහිත කලාපයක් ලෙස ද මෙම ප්‍රදේශය හැඳින්විය හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


Bell, H.C.P., (1904), Report on the Kegalle District of the Province of Sabaragamuwa, Archaeological Survey of Ceylon, Colombo.

Paranavitana,S., (1970), Inscriptions of Ceylon, Vol.I, Archaeological Survey of Ceylon ,Colombo.

රඹුක්වැල්ල, චූලනි, (1998), පදියගම්පොළ ප්‍රදේශයේ ප්‍රාථමික යකඩ යුගයේ පුරාවිද්‍යාව : පුරාවිද්‍යාස්ථාන ස්ථානගතවීමේ වැදගත්කම, Anciant Ceylon, No.18, Department of Archaeology, Colombo.